# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වෙරළ සංරක්ෂණ (සංශෝධන)

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා ද 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව පනතේ සහ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ ඇතැම් විධිවිධාන සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2011 අගෝස්තු මස 26 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 පෙබරවාරි මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[119 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 31.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින්, (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි දීර්ඝ නාමය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ විෂය ක්ෂේත්‍රය තුළට ගෙනෙනු ලැබූ වෙරළ සම්පත් කළමනාකරණ ප්‍රදේශ දක්වනු ලැබේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට පොදු සංශෝධනයක් කරනු ලබන අතර, එමගින් එහි දක්වා ඇති "වෙරළ සංරක්ෂණ පනත", "වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා", "අධ්‍යක්ෂවරයා", සහ "වෙරළ සංරක්ෂණය" යන වචන වෙනුවට පිළිවෙලින් "වෙරළ සංරක්ෂණ" සහ "වෙරළ සම්පත් කළමනාකරණය", "වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා", "අධ්‍යක්ෂ ජනරාල්වරයා" සහ "වෙරළ සංරක්ෂණ" සහ "වෙරළ සම්පත් කළමනාකරණය" යන වචන ආදේශ කරනු ලැබේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් පත් කිරීමට විධිවිධාන සලසනු ලබයි.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, පහත දැක්වෙන බලතල එකතු කිරීමෙන් පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල ක්ෂේත්‍රය පුළුල් කරනු ලැබේ:—

(අ) වෙරළ කලාපය ඇතුළත වෙනත් අනුයෝජ්‍යායතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම;

(ආ) වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) වෙරළ සංරක්ෂණය පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීම; සහ

(ඈ) වෙරළ සංරක්ෂණය කළමනාකරණ වැඩපිළිවෙල පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ එවැනි වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය වූ, පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වඩාත් පුළුල් ලෙස ස්වකීය බලතල පවරා දීමයි.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය වූ පරිදි වූ එකී වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, උපදේශක සභාව සංයුක්ත කරනු ලබන සාමාජිකයන්ගේ වෙනසක් ඇති කිරීම වේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය වූ පරිදි ඒ වගන්තිය මගින් වෙරළ කලාපය තුළ පවතින සියලු සම්පත් හා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල අඩංගුකොට ඒ සම්බන්ධයෙන් වාර්තාවක් පළ කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම කරනු ලැබේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට වසර තුනක් ඇතුළත වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම කරනු ලබන අතර, එකී සැලැස්මේ ඇතුළත් විය යුතු කාරණා ද එමගින් දක්වනු ලැබේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එකී සංශෝධනය ප්‍රධාන ප්‍රඥප්තියට මෙහි 3 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එකී සංශෝධනය ප්‍රධාන ප්‍රඥප්තියට මෙහි 3 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

12 වන *වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, සංවර්ධන ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේ පටිපාටිය සම්බන්ධයෙන් වඩා විස්තරාත්මක ක්‍රියාපටිපාටියක් දක්වනු ලැබේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එකී සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තියට මෙහි 3 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව අවසර පත්‍ර වෙනත් කෙනෙකුට පැවරීමට විධිවිධාන සලසනු ලැබේ.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර:—

(අ) එය මේ පනතේ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ; සහ

(ආ) ඒ මගින්, අවසරපත්‍ර ලාභියා වෙත දැන්වීම බාරදීම වෙනුවට දැන්වීම ලියාපදිංචි තැපෑලෙන් ඔහු වෙත යැවීම සඳහා විධිවිධාන සලසනු ලබයි.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, අවලංගු කිරීම පිළිබඳ වූ දැන්වීම, අවසරපත්‍රලාභීන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවීම සඳහා විධිවිධාන සලසනු ලබයි.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය —

(අ) මේ පනතේ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වන්නේ ය;

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියලු අදාළ ලියවිලි සහ ලිපිගොනු දින දාහතරක් (14) ඇතුළත ලේකම්වරයා වෙත යැවීමට විධිවිධාන සලසන්නේ ය; සහ

(ඇ) ලේකම්වරයා විසින්, ඔහු වෙත එවන ලද අභියාචනා දින 60 ක් ඇතුළත බැහැර කළ යුතු බවට විධිවිධාන සලසන්නේ ය.

*18 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 22අ අලුත් වගන්තියක් ඇතුළත් කරන අතර සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතට යටත් වෙරළ කලාපය ඇතුළත යම් ප්‍රදේශයන් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව කැමැත්ත නොමැතිව කිසිදු අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතු බවට ද, එකී අවසර පත ලබා ගැනීම සඳහා වූ පටිපාටිය සම්බන්ධයෙන් ද විධිවිධාන සලසනු ලැබේ.

*19 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් කොටසක් ඇතුළත් කරනු ලබන අතර, එකී අලුත් කොටස් මගින්:—

(අ) බලපෑමට යටත්වන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ ඒ ප්‍රදේශවල සියලු ක්‍රියාකාරකම් තහනම් කිරීම (iiiඅ කොටස);

(ආ) වෙරළ උද්‍යාන සහ සංරක්ෂණ ප්‍රදේශ (iiiආ කොටස) ප්‍රකාශයට පත් කිරීම සහ වෙරළ උද්‍යාන පරිපාලනය කිරීම සඳහා නියෝග සෑදීම සඳහා ද, සංරක්ෂණ ප්‍රදේශ තුළ විද්‍යාත්මක අධ්‍යයනයන් හෝ පර්යේෂණ සඳහා හැර අනෙකුත් සියලු සංවර්ධන කටයුතු තහනම් කිරීම;

(ඇ) යම් ප්‍රදේශයන් තුළ සම්පත් කළමනාකරණය පිණිස සහයෝගයෙන් ක්‍රියාකිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය ඇති විටෙක, (iii ඇ කොටස) විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම; සහ

(ඈ) වෙරළ කලාපවලට ප්‍රවිෂ්ඨවීමේ මාර්ග පිළිබඳ වෙරළ ප්‍රවේශ සැලැස්මක් සකස් කිරීම සහ එකී සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාපටිපාටිය ද,

සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

*20 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, වෙරළ කලාප තුළ කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්, විද්‍යාත්මක අධ්‍යයනයන් සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා පමණක් සීමා කිරීම් කරනු ලැබේ.

*21 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින්—

(අ) වෙරළ කලාපයට බලෙන් ඇතුළුවීම් සම්බන්ධයෙන් හෝ වෙරළ කලාපය තුළ අවසර නොලත් කටයුත්තක් කරගෙන යනු ලබන අවස්ථාවක හෝ අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය;

(ආ) වරදකරුට, කරන ලද වරද නිවැරදි කරගැනීමට හෝ එවැනි අවසර නොලත් ක්‍රියාකාරකම්වල නියැලීම නැවැත්වීමට හෝ එවැනි දේවලින් වැළකී සිටීමට නියම කිරීමේ බලතල අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරීම; සහ

(ඇ) වරද කරනු ලබන තැනැත්තන් විසින් ඉහත කී ලෙස බලෙන් ඇතුළුවීම හෝ අවසරනොලත් කටයුතු කිරීම දිගටම කරගෙන යනු ලබන විටෙක ඒවා නතර කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පියවරගනු ලැබීමද සහ ඒ සම්බන්ධයෙන් උපචිත වන වියදම් ඒ පිළිබඳව දැන්වීම් කරනු ලැබූ වරදකරුගෙන් අය කරගැනීම ද,

සඳහා විධිවිධාන සලසනු ලැබේ.

*22 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින්, පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රවලට අදාළව විධිවිධාන සලකනු ලැබේ.

*23 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 26අ වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තිය මගින්, යම් සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන්නා වූ යම් හානියක් හෝ පාඩුවක් වැළැක්වීම සඳහා හෝ නැවැත්වීම සඳහා නියෝග නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා බලය පවරනු ලැබේ.

*24 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තිය මගින්, දැන්වීමක් යවනු ලැබූ යම් තැනැත්තකු විසින් සිහිකැඳවීමක් කිරීමෙන් පසුවත් ඊට අනුකූලව ක්‍රියා නොකළ විටෙක ඔහුට නිකුත් කොට ඇති බලපත්‍රය අවලංගු කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

*25 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තිය මගින් 14 වන වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පනවන ලද දඩ මුදල් වැඩි කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

*26 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් එකී වගන්තියට ආනුෂංගික සංශෝධනයක් කරනු ලබන අතර ම, එකී වගන්තියේ සඳහන් දඩ මුදල වැඩි කිරීම සඳහා විධිවිධාන සැලසීමද කරනු ලැබේ.

*27 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තිය මගින් එහි ඇතුළත් දඩ මුදල වැඩි කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

*28 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තිය මගින්, අභියාචන විභාග කිරීමේ දී ලේකම්වරයා අනුගමනය කරන ක්‍රියාපටිපාටිය තවත් දැඩි කරනු ලබයි.

*29 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 31 ආආ, අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තිය මගින් වෙරළ කලාපය ඇතුළත හෝ ඉන් පිටත මුහුදු කොරල් සඳහා කැණීම් කිරීම තහනම් කිරීම සඳහා විධිවිධාන සලසනු ලබයි.

*30 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඉ වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට ආදේශ කරනු ලැබූ වගන්තිය මගින් යම් වැලි හෝ සිප්පිකටු ප්‍රවාහනය කරනු ලබන වාහන එකී ද්‍රව්‍ය නීත්‍යානුකූලව ලබාගෙන තිබේ ද යන්න සහතික කරගැනීම සඳහා පරීක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන සලසනු ලැබේ.

*31 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින් පොලිසියේ ත්‍යාග අරමුදල වෙනුවට වෙරළ ආරක්ෂක අරමුදල ආදේශ කරනු ලබන අතර, එකී අරමුදල පරිපාලනය කිරීම සඳහා සහ එහි ගිණුම් පවත්වාගෙන යාම සඳහා ද විධිවිධාන සලසනු ලැබේ.

*32 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 31උ සහ 31ඌ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තිය මගින්,

(අ) ඉඩම් පිරවීම සහ ජලස්කන්ධ පිරවීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය නොමැතිව කිරීම වරදක් බවට ද ; සහ

(ආ) නීතිකෘත්‍යය පවතින අතරතුර දී ඇප නොදිය යුතු බවට ද,

විධිවිධාන සලසනු ලැබේ.

*33 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තිය මගින්, යම් තැනැත්තකු කරන ලද බවට සැකකරනු ලබන වරදට දිය යුතු දඬුවම මාස 6 කට වඩා වැඩිකලක් සඳහා බන්ධනාගාරගත කිරීම වන විටෙක, එවැනි තැනැත්තන් වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම සඳහා පොලීසියට බලය පැවරීම පිණිස විධිවිධාන සලසනු ලැබේ.

***34 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 35අඅ සහ 35 අඅඅ අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තිය මගින් පනත යටතේ වූ වැරදි, සංඥෙය වැරදි විය යුතු බවට සැලසීම සහ සද්භාවයෙන් කරනු ලබන නීත්‍යනුකූල ක්‍රියා සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන්ට නිර්මුක්තිය ලබාදීම ද සඳහා විධිවිධාන සලසනු ලැබේ.

***36 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ අර්ථනිරූපණ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය මගින්, “වෙරළ ප්‍රවේශය”, “වෙරළ සම්පත් කළමනාකරණය”, “මූලික පරිසර පරීක්ෂණ වාර්තාව", “තිරසාරභාවය” සහ “ජලස්කන්ධ” යන අලුත් යෙදුම්වල නිර්වචන ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසනු ලැබේ.

***37 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට උප ලේඛනයක් ඇතළත් කරනු ලබන අතර, එකී උපලේඛනය මගින්, මේ සංශෝධන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනවලට ආනුෂංගිකව 1968 අංක 15 දරන ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව පනතට සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතට කරනු ලබන සංශෝධන දක්වනු ලැබේ.

එල්.ඩී.—ඕ. 47/90.

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා ද 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව පනතේ සහ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ ඇතැම් විධිවිධාන සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක      දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය.

1981 අංක 57 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය"යනුවෙන් සඳහන් කරනු ලබන), 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ දීර්ඝ නාමය "වෙරළ සංරක්ෂණය සඳහා වැඩ යෝජනා ක්‍රම" යන වචන වෙනුවට, "වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වැඩ යෝජනා ක්‍රම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"වෙරළ සංරක්ෂණ පනත", "වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ", "අධ්‍යක්ෂ" සහ "වෙරළ සංරක්ෂණය", යන්න "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත", "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්" "අධ්‍යක්ෂ ජනරාල්"සහ "වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය" යනුවෙන් හැඳින්විය යුතු බව.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක—

(අ) "වෙරළ සංරක්ෂණ පනත" යන වචන වෙනුවට "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත" යන වචන ද ;

(ආ) "වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ" යන වචන වෙනුවට "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් " යන වචන ද ;

(ඇ) "අධ්‍යක්ෂ" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්" යන වචන ද ; සහ

2—PL 06211—1,000 (2011/08)

(ඇ) "වෙරළ සංරක්ෂණය" යන වචන වෙනුවට "වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය" යන වචන ද ආදේශ කරනු ලැබේ.

(2) යම් දැන්වීමක, නිවේදනයක, හෝ වෙනත් ලේඛනයක ඇත්තා වූ "වෙරළ සංරක්ෂණ පනත ", "වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂක" "අධ්‍යක්ෂක" සහ "වෙරළ සංරක්ෂණය" යන්න පිළිබඳ වූ සෑම සඳහනක්ම පිළිවෙලින් "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත", "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්" "අධ්‍යක්ෂ ජනරාල් " සහ "වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය" සඳහා වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඒ වගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(i) අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් යම් සංඛ්‍යාවක් ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ, (ආ) ඡේදයේ "ක්‍රියාවෙහි යෙදවීම; සහ" යන වෙනුවට "ක්‍රියාවේ යෙදවීම; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඇ) වෙරළ කලාපය ඇතුළත කරගෙන යනු ලබන කටයුතු සම්බන්ධයෙන් වෙනත් දෙපාර්තමේන්තුවල, ආයතනවල සහ නියෝජ්‍ය ආයතනවල කටයුතු සමායෝජනය කිරීම සඳහා ;

(ඈ) 12 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ;

(ඉ) වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු ජනතාව හා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන හා ආයතන වෙත පතුරුවා හැරීම හා අවශ්‍ය වූ විටෙක උපදෙස් හා මාර්ගෝපදේශකත්වය ලබා දීම සඳහා ;

(ඊ) ඵලදායී වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණය සහතික කිරීමේ කාර්යය සඳහා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන හා ආයතන සමග සහයෝගයෙන් පර්යේෂණ පවත්වාගෙන යාම සඳහා; සහ

(උ) ජාතික ධීවර ප්‍රතිපත්තියේ සඳහන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා .”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“අධ්‍යක්ෂ ජනරාල් විසින් පනත යටතේ වූ ස්වකීය බලතල ආදිය කිසිවක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට හෝ නියමිත නිලධරයන් වෙත පැවරිය හැකි බව.

**5.** පනතේ III වන කොටස ඇතුළත වූ යම් බලතල කිසිවක් කාර්යයක් හෝ කර්තව්‍යයක් නොවන, මේ පනත මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරුණු, පැනවුනු හෝ නියම කෙරුණු යම් බලතල කිසිවක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් අවස්ථාවෝචිත පරිදි වෙරළ කලාපයේ යම් කොටසක් ඇතුළත පිහිටියාවූ යම් ප්‍රදේශයක, ප්‍රාදේශීය ලේකම් වෙත හෝ යම් නියමිත රාජ්‍ය නිලධරයකු වෙත, ඒ සඳහා ලියවිල්ලකින් වූ බලය පැවරීමක් මගින් අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකිය. එසේ පවරනු ලැබූ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, ඒ ප්‍රාදේශීය ලේකම් හෝ නියමිත රාජ්‍ය නිලධරයා හෝ විසින් එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ වෙනත් බල ප්‍රදේශයක් ඇතුළත ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 6වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව.

6. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "උපදේශක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය:—

(අ) සභාපතිවරයා විය යුතු, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) ප්‍රතිපත්ති සැලසුම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඇ) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඈ) නාගරික සංවර්ධනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඉ) රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඊ) කර්මාන්ත පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(උ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඌ) පරිසරය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(එ) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ පත් කරන ලද ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඒ) 1981 අංක 54 දරන ධීවර සහ ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත යටතේ පත් කරන ලද ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඔ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පත් කරන ලද, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පත්කරන ලද, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයා ;

(ක) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ පත් කරන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයා ;

(ග) ඉඩම් කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ච) සභාවේ ලේකම්වරයා විය යුතු, 3 වන වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල් ; සහ

(ජ) විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය නියෝජනය වන අය අතුරින් එක් අයකු ද, වෙරළ පරිසරය ආරක්ෂා කිරීමට සම්බන්ධ ආණ්ඩුවේ නොවන සංවිධාන නියෝජනය කරනු ලබන එක් අයකු සහ ධීවර කර්මාන්තයේ නියෝජිතයකු විය යුතු වෙනත්

අයකු ද, වන්නා වූ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් තිදෙනකු.

(2) උපදේශක සභාව විසින්, එහි කර්තව්‍ය ඵලදායී ලෙස ඉටුකිරීමෙහි ලා අවශ්‍ය යයි එහි මතය වන්නා වූ අවස්ථාවක, ඒ කාර්ය සඳහා අවශ්‍යවන තාක් කල්, උපදේශක සභාවේ සාමාජිකයකු වශයෙන් සේවය කිරීම සඳහා වෙනත් යම් ලේකම්වරයකු අනුයුක්ත කර ගනු ලැබිය හැකිය. මේ උපවගන්තිය ප්‍රකාර අනුයුක්ත කරගත් ලේකම්වරයකු, ඔහුගේ පැමිණීම අවශ්‍ය වූ නිශ්චිත කාරණය සාකච්ඡා කරනු ලබන විටක දී පමණක් උපදේශක සභාවේ රැස්වීම්වලට පැමිණිය යුතු ය. ඒ රැස්වීම්වල දී ඡන්දය දීමේ හිමිකමක්, ඔහුට නොතිබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

“වෙරළ කලාපය ඇතුළත සම්පත් සමීක්ෂණය.

11. (1) අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙරළ කලාපය ඇතුළත සියලු සම්පත් හා කටයුතු පිළිබඳ සමීක්ෂණයක් ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින් කරනු ලැබිය යුතු අතර, ඒ සමීක්ෂණයේ ප්‍රතිඵල මත පදනම් වූ වාර්තාවක් ඉන්පසුව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ නියමිත වාර්තාව පිළියෙල කිරීමේ දී, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, ආයතන හෝ නියෝජ්‍යායතන විසින් එක් රැස්කරන ලද හෝ සම්පාදනය කරන ලද අදාළ දත්ත හා තොරතුරු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල් විසින් සැලකිල්ල දැක්විය යුතු ය. ඒ වාර්තාව පිළියෙල කිරීමේ කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් යුක්තිසහගත ලෙස අවශ්‍ය කරනු ලැබිය

හැකි යම් දත්ත හෝ තොරතුරු සැපයීම ඒ දෙපාර්තමේන්තු ආයතන හා නියෝජ්‍ය ආයතනවල කාර්යය විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි —

(අ) "11 වන වගන්තිය ප්‍රකාර" යන වචනවල පටන් "ඒ සැලැස්මෙහි ඇතුළත් විය යුතු ය" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"11 වන වගන්තිය ප්‍රකාර, කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කර ගත් (මෙහි මින් මතු "සැලැස්ම" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මක්, මේ පනත ක්‍රියාත්මක වූ දින සිට අවුරුදු 3ක් ඉකුත් වීමට පෙර, අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළියෙල කොට උපදේශක සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. සැලැස්මෙහි, වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වූ මාර්ගෝපදේශ හා තිරසාර සංවර්ධනය සඳහා වෙරළ සම්පත් සංරක්ෂණය සම්බන්ධයෙන් වූ සවිස්තර වැඩසටහනක් ඇතුළත් විය යුතු ය. තව ද,—;

(ආ) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ix) වන සහ (x) වන අයිතමයන් වෙනුවට පහත දැක්වෙන අයිතමයන් ආදේශ කිරීමෙන් :—

"(ix) කෘෂි කර්මාන්තය ;

(x) කර්මාන්තය ;

(xi) වෙරළ සම්පත් ලබා ගැනීම සඳහා තිබීම ;

(xii) වෙරළ ඛාදන කළමනාකරණය;

(xiii) වෙරළ ආශ්‍රිත ජලයේ ගුණාත්මක භාවය ;

(xiv) වෙරළ ආශ්‍රිත ජල භාවිතය කලාප වශයෙන් වෙන් කිරීම ; සහ

(xv) අධ්‍යක්ෂ ජනරාල්ගේ මතය අනුව, වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණයට අදාළ වෙනත් යම් කාරණා .";

(ඇ) එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "පරිපූර්ණ වැඩසටහනක්; සහ" යන වචන වෙනුවට" පරිපූර්ණ වැඩසටහනක් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි "සඳහා වූ නිර්දේශ," යන වචන වෙනුවට "සඳහා වූ නිර්දේශ ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එහි (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ඊ) විශේෂ ප්‍රදේශ කළමනාකරණ බිම් කොටස් හඳුනාගනිමින් නිර්දේශ කිරීම, සහ එකී බිම් කොටස්, සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළුවල උග්‍රභාවය, ජෛව විවිධත්වය, ප්‍රායෝගික බව සහ ආර්ථික වැදගත්කම අනුසාරයෙන් ප්‍රමාණනය කිරීම;

(උ) වෙරළට හා වෙරළ කලාපයට ප්‍රවේශවීම සඳහා මහජනයා වෙනුවෙන් ඇති ප්‍රවේශ මාර්ග, අඩිපාරවල් සහ පටු මංතීරු හඳුනාගැනීම හා එහි ඇති අවහිරතා ඉවත් කිරීමෙහි ලා අවශ්‍ය පියවර නිර්දේශ කිරීම;

(ඌ) වෙරළ කලාපයේ තිරසාර සංවර්ධනය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ නිර්දේශ කිරීම ; සහ

(එ) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම" ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) 12 වන වගන්තිය ප්‍රකාර පිළියෙළ කරන ලද සැලැස්ම යටත් පිරිසෙයින් සෑම අවුරුදු 5 කට වරක් ප්‍රතියෝජනය කිරීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු සැලැස්විය යුතු ය :

එසේ වුවද, අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල් විසින් සලකනු ලබන අවස්ථාක සැලැස්ම ප්‍රතියෝජනය කරන වේලාවේදී 11 වන වගන්තිය ප්‍රකාර මැනීමක් කිරීමට සලස්වා එසේ කරන ලද මැනීමේ ප්‍රතිඵල පදනම් කොට සැලැස්ම ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි ය. ".

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "අවුරුදු හතරක කාලය" යන වචන යෙදෙන කවර තැනෙක වුවද "අවුරුදු පහක කාලය" යන වචන ආදේශ කිරීමෙන්.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, ඒ වගන්තියේ "පරිසරයේ තත්ත්වය" යන වචන වෙනුවට "පරිසරයේ තත්ත්වය හා වෙරළ කලාපය ඇතුළත සම්පත්වල ධාරකි ශක්තිය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්මට" යන වචන වෙනුවට "වෙරළ කලාපය සහ වෙරළ සම්පත් කළමනාකරණය කිරීමේ සැලැස්මට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "පරිසරයේ තත්වය" යන වචන වෙනුවට "පරිසරයේ තත්ත්වය සහ වෙරළ කලාපය ඇතුළත සම්පත්වල ධාරක ශක්තිය" යන වචන ආදේශ කිරීමෙන් .

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) 14 වන උපවගන්තියේ (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි, වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කටයුත්තක නියුක්තවීම පිණිස, අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පතක් ලැබුණ විට, අවස්ථාවෝචිත පරිදි, සංවර්ධන කටයුත්තට අදාළ මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් හෝ ඒ වාර්තා දෙකම හෝ සපයන ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය. ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඉල්ලුම්කරුගේ කාර්යය විය යුතු ය. සෑම මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත් විය යුතු ය.

එසේ වුවද, මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් අවශ්‍ය නොවන සංවර්ධන කටයුතු කාණ්ඩ, අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල් විසින් මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් ඉල්ලන ලද අවස්ථාවක දී, ඒ වාර්තාව ලැබුණ විට, අවසර පත්‍ර ලබා දීම හෝ නොදීම නිශ්චය කිරීමේ කාර්ය සඳහා ඒ වාර්තාව ප්‍රමාණවත් යයි පෙනී යන්නේ නම්, පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සැපයීමේ නියමය ඔහු විසින් නොසලකා හරිනු ලැබිය හැකිය.

(2අ) අවසර පත්‍රය නිකුත් කිරීම හෝ නොකිරීම නිශ්චය කිරීම සඳහා මූලික පරිසර පරීක්ෂණ වාර්තාව ප්‍රමාණවත් යයි අධ්‍යක්ෂ ජනරාල් විසින් සලකනු ලබන අවස්ථාවක, ඒ වාර්තාවේ පිටපතක් ඔහු විසින් විස්තර විවේචන කිසිවක් ඇතොත් ඉදිරිපත් කිරීම සඳහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2ආ) සභාව විසින්, මූලික පරිසර පරීක්ෂණ වාර්තාව තමන් වෙත ඉදිරිපත් කිරීමෙන් දින තිහක් ඇතුළත, ස්වකීය විස්තර විවේචන කිසිවක් ඇතොත්, අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2ඇ) (2අ) උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද මූලික පරිසර පරීක්ෂණ වාර්තාව සැලකිල්ලට ගැනීමෙන් පසුව, තීරණයකට එළඹීම සඳහා පරිසර බලපෑම් තක්සේරු වාර්තාවක් අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල් විසින් සලකනු ලැබ ඇති අවස්ථාවක, එය තමා වෙත ඉදිරිපත් කළ යුතු යයි ඔහු විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(2ඈ) පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ලැබුණු විට, අධ්‍යක්ෂ ජනරාල් විසින් එහි පිටපතක්, කමිටුවේ විවේචන ලබා ගැනීම සඳහා එය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, ඒ නිවේදනයේ දින සිට දින තිහක් ඇතුළත ඒ පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් මහජනයාට ලබා දිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙන් "(3) වන උපවගන්තිය යටතේ " යන වචන වෙනුවට "(2අ), (2ඇ) සහ 3 වන උපවගන්ති යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි "(3) වන උපවගන්තිය යටතේ " යන වචන වෙනුවට "(2අ), (2ඇ) සහ (3) වන උපවගන්ති යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය එහි "වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්ම" යන වචන වෙනුවට "වෙරළ කලාපය සහ වෙරළ සම්පත් කළමනාකරණය කිරීමේ සැලැස්ම" යන වචන ආදේශ කිරීමෙන් ද, "වෙරළ කලාපයේ නිසි කළමනාකාරීත්වය" යන වචන වෙනුවට "වෙරළ කලාපයේ සහ ඒ තුළ ඇති සම්පත්වල නිසි කළමනාකාරීත්වය" යන වචන ආදේශ කිරීමෙන් ද, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) මේ කොටස යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව වෙනත් තැනැත්තකුට පැවරීම නොකළ යුතු ය. පැවරීමක් සඳහා අධ්‍යක්ෂක ජනරාල් එවැනි අනුමතයක් දුන් අවස්ථාවක, ඔහු විසින්, ඒ අවසර පත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර කොන්දේසි පනවනු ලැබිය හැකි ය. නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට පමණක් මාරුකිරීමක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. පැවරීම බලාත්මක වීම සඳහා, අවසර පත්‍රය පැවරීමේ නියමයක් ද, අවසර පත්‍රයේ ඇතුළත් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, අවසර පත්‍රය නිකුත් කරන ලැබූ මුල් දිනයේ පටන් අවුරුදු දෙකක් ඉකුත් වී ඇත්නම් මිස, අධ්‍යක්ෂ ජනරාල් විසින්, මේ වගන්තිය යටතේ නියමයක් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "වෙරළ කලාපයේ" යන වචන වෙනුවට, "වෙරළ කලාපයේ හෝ ඒ තුළ ඇති සම්පත් වල" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) "අවසරපත්‍ර හිමියා වෙත භාරදෙනු ලැබීමට" යන වචන වෙනුවට, "අවසරපත්‍ර හිමියා විසින්, අවසරපත්‍රය සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියවිල්ලකින් ඔහු විසින් දන්වා ඇති වෙනත් යම් ලිපිනයකට ලියාපදිංචි තැපෑලෙන් යැවීමට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "අධ්‍යක්ෂවරයා විසින්" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, "හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් දීර්ඝ කරන ලද යම් කාල පරිච්ඡේදයක් ඇතුළත, ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය. ඒ අවලංගු කිරීම පිළිබඳ දැන්වීම, ඒ සම්බන්ධයෙන් හේතු දක්වමින්, අවසරපත්‍ර හිමියා විසින් ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියවිල්ලකින් දන්වා ඇති වෙනත් යම් ලිපිනයකට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.". යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන්;

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ "වෙරළ සංරක්ෂණය පිළිබඳ විෂයය" යන වචන වෙනුවට, "වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය පිළිබඳ විෂයය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:—

"(2) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ලැබුණු වහාම අදාළ සියලු ලේඛන හා ලිපිගොනු තමා වෙත ඉදිරිපත් කරන ලෙස ලේකම් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීම ලැබීමෙන් දින දාහතරක කාල පරිච්ඡේදයක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ ඉල්ලීමට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් තමා වෙත ලැබීමෙන් දින හැටක් ඇතුළත ලේකම් විසින් කාරණය පිළිබඳව තීරණය කොට, ඔහුගේ තීරණය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල් වෙත හා අභියාචනය කරන පාර්ශවකරු වෙත දැනුම් දිය යුතු ය. අභියාචනයක් පිළිබඳව ලේකම්ගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(4) අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්ගේ තීරණය ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යය විය යුතු ය.

(5) අභියාචනයක දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය නියමිත පරිදි විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 22අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අදාළ කිරීම.

22අ. (1) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශ, අධ්‍යක්ෂ විසින්, වෙරළ ප්‍රදේශය ඇතුළත ඇති ප්‍රදේශයකට අදාළව මේ පනතේ විධිවිධාන යටතේ වූ අවසර පත්‍රයක් නිකුත් කිරීම, ඒ නිකුත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය නොමැතිව, කරනු නොලැබිය යුතු ය.

(2) භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශ අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් විසින් තම

කැමැත්ත දෙනු ලබන විටක, අවස්ථානුකූලව අවශ්‍ය යැයි අධ්‍යක්ෂ ජනරාල් විසින් සලකනු ලබන කොන්දේසි එසේ දෙනු ලබන අවසර පත්‍රයට ඇමිණිය යුතු බවට නියම කරනු ලැබිය හැකි ය.

(3) භූ විද්‍යා සහ පතල් කාර්යාංශ අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර පත්‍රයක් නිකුත් කරන ලද තැනැත්තකු, එකී අවසර පත්‍රයට අමුණා ඇති කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල් විසින්, ඒ පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දිය යුතු ය.

(4) ඒ නිවේදනය ලැබුණු විට, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ අධ්‍යක්ෂ ජනරාල් විසින්, අවසර පත්‍රයේ විධිවිධාන උල්ලංඝනය කළ අවසරපත්‍රධාරියා වෙත, විධානයේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත හෝ ඒ කාල පරිච්ඡේදය දීර්ඝ කරනු ලැබූ යම් පසු දිනයක හෝ ඊට අනුකූලව කටයුතු කළ යුතු බවට වූ විධානයක් නිකුත් කරනු ලැබිය යුතු ය. විධානයට අනුකූලව කටයුතු කිරීම අවසරපත්‍රධාරියා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ අධ්‍යක්ෂ ජනරාල් විසින්, අධ්‍යක්ෂ ජනරාල් විමසා අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර, අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 38 වන, 39 වන සහ 40 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ, IIIආ, IIIඇ සහ IIIඈ අලුත් කොටස් ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් කොටස් මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 111අ, 111ආ, 111ඇ සහ 111ඈ යන කොටස් (22ආ, 22ඇ, 22ඈ, 22ඉ, 22ඊ සහ 22උ වගන්ති) වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"IIIඅ කොටස

**බලපෑමට යටත්වන ප්‍රදේශ**

බලපෑමට යටත්වන ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම.

22.ආ (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින්:—

(අ) වෙරළ කලාපය ඇතුළත හෝ වෙරළ කලාපයට යාබදව හෝ ඒ ප්‍රදේශ දෙකටම ඇතුළත වූ; හෝ

(ආ) යම් ජල ස්කන්ධයක් හෝ යම් ජල ස්කන්ධයක කොටසක් ඇතුළත ; හෝ

(ඇ) යම් කලපුවක හෝ කලපුවක කොටසක හෝ කලපුවක යම් පර්යන්ත ප්‍රදේශයක,

යම් ප්‍රදේශයක් "බලපෑමට යටත්වන ප්‍රදේශයක්" වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි ය.

(2) 14 වන වගන්තිය යටතේ ලබාගත් අවසර පත්‍රයක් ප්‍රකාර, කරගෙන යා හැකි යම් සංවර්ධන කටයුත්තක්, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපෑමට යටත්වන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශයක කරගෙන යනු ලබන්නේ නම්, එය තහනම් කටයුත්තක් වශයෙන් සලකනු ලැබිය හැකි ය. තහනම් කටයුත්තක නියැලෙන යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

(3) කිසිම තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ බලපෑමට යටත්වන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත යම් ප්‍රදේශයක ඒ ප්‍රදේශයේ ජලජ හෝ මුහුදු දිවියට හානි විය හැකි පිරවීමක්, ඉදිකිරීමක්, තැනීමක්, අවහිර කිරීමක්, අපවිත්‍ර කිරීමක්, යම් අපද්‍රව්‍ය දැමීමක් හෝ වෙනත් යම් ක්‍රියාවක් කරනු නොලැබිය යුතු ය. ඒ ප්‍රදේශයේ පිරවීමක්, ඉදිකිරීමක්, තැනීමක්, අවහිර කිරීමක්, අපවිත්‍ර කිරීමක්, යම් අපද්‍රව්‍ය දැමීමක් කරන හෝ ඒ ප්‍රදේශයේ ජලජ හෝ මුහුදු ජීවිතයට හානි විය හැකි වෙන යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන කඩකරමින් කරගෙන යනු ලබන යම් සංවර්ධන කටයුත්තකට හෝ ඊට අදාළව, 27අ වගන්තියේ හෝ 28 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) ප්‍රශ්නයට අදාළ ක්‍රියාව බලපෑමට යටත්වූ ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශයක දී කරන ලදැයි ඔප්පු කිරීමේ භාරය එහි නිරත වූ තැනැත්තා මත පැවරෙන්නේ ය.

(6) මේ ප්‍රදේශ පරිපාලනය කළ යුතු ආකාරය සහ ඒ ප්‍රදේශ ඇතුළත කිරීමට තහනම් කරනු ලබන කටයුතු දැක්වෙන නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

## IIIආ කොටස

### වෙරළ උද්‍යාන සහ සංරක්ෂණ ප්‍රදේශ

**වෙරළ උද්‍යාන.**

22ඇ. (1) වෙරළ කලාපය ඇතුළත යම් ප්‍රදේශයක ස්වාභාවික දර්ශනීයත්වය සහ ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම අවශ්‍ය යයි අමාත්‍යවරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, වෙරළ කලාපය ඇතුළත වූ ප්‍රදේශයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් "වෙරළ උද්‍යානයක්" වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) ඒ උද්‍යාන පරිපාලනය කළ යුතු ආකාරය, ඒ ප්‍රදේශය ඇතුළත කරගෙන යා හැකි කටයුතු සහ ඒ ප්‍රදේශවලට ඇතුල්වීමට අවසර දෙනු ලබන තැනැත්තන් දැක්වෙන නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

**සංරක්ෂණ ප්‍රදේශ.**

22ඈ (1) වෙරළ හා ජලජ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා යම් ප්‍රදේශයක් තුළ විශේෂ පියවර ගත යුතු විටෙක අමාත්‍යවරයා විසින් එවැනි ප්‍රදේශයක් "සංරක්ෂණ ප්‍රදේශයක්" වශයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශිත යම් ප්‍රදේශයක කිසිදු සංවර්ධන කටයුත්තක් හෝ ජලජ සම්පත් එකතු කිරීමක් සහ එක්රැස් කිරීමක් කරනු නොලැබිය යුතු ය. කෙසේ වුව ද අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ ප්‍රදේශය ඇතුළත විද්‍යාත්මක අධ්‍යයන හා පර්යේෂණවල නිරතවීමට අදහස් කරන තැනැත්තන් වෙත, නියමිත ආකෘතියට අනුව කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් අවසර පත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, ඒ ප්‍රදේශ පරිපාලනය කිරීමේ ආකාරය සහ ක්‍රමය, ඒ ප්‍රදේශවල අවසර දී ඇති ක්‍රියාකාරකම් සහ ඒ ප්‍රදේශ ඇතුළත එකී ක්‍රියාකාරකම්වල නිරතවිය හැකි තැනැත්තන් නියම කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය.

## III ඇ කොටස

### විශේෂ කළමනාකරණ ප්‍රදේශ.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ.

22ඉ. (1) නිශ්චිත භූ විද්‍යාත්මක ප්‍රදේශයක් ඇතුළත සම්පත් කළමනාකරණය සැලසුම් කිරීම සඳහා සහයෝගිතා එළඹුමක් අවශ්‍ය යයි තමාට පෙනී යන්නේ නම්, අමාත්‍යවරයා විසින්, වෙරළ කලාපය ඇතුළත වූ හෝ වෙරළ කලාපයට යාබද වූ හෝ වෙරළ කලාපය සහ යාබද ඉඩම් ප්‍රදේශ යන දෙකෙන්ම සමන්විත වූ ප්‍රදේශයන් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක්, මගින් "විශේෂ කළමනාකරණ ප්‍රදේශයක්" වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, කිසිම ප්‍රදේශයක්, ඒ ප්‍රදේශය, මේ පනතේ විධිවිධාන යටතේ පිළියෙල කරන ලද වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තේ නම් මිස, විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු නොලැබිය යුතු ය.

(2) යම් විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් පරිපාලනය කළ යුතු ආකාරය හා ක්‍රමය හා එය කළ යුතු තැනැත්තන් ද, ඒ ප්‍රදේශවලට ප්‍රවේශවීමට හිමිකම ඇති තැනැත්තන් සහ ඒ ප්‍රදේශ ඇතුළත කළ හැකි කටයුතු ද නියම කෙරෙන නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

### IIIඈ කොටස

### වෙරළ ප්‍රවේශ සැලැස්ම

වෙරළ ප්‍රවේශ සැලැස්ම.

22ඊ (1) මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල් විසින්, හැකි පහසු ඉක්මණින්, මහජනතාවට වෙරළට ප්‍රවේශ විය හැකි සහ වෙරළ කළාපයට ප්‍රවේශ විය හැකි සියලු මාර්ග, පාරවල් සහ පටු මංතීරු හඳුනා ගතහැකි සමීක්ෂණයක් සිදු කිරීමට සැලැස්විය යුතු ය. සමීක්ෂණයේ සොයා ගැනීම් මත පදනම් වූ පෘථුල වාර්තාවක් ඔහු විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එය කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම වාර්තාව සකස් කිරීම සඳහා යුක්ති සහගත ලෙස තමාට අවශ්‍ය තොරතුරු, ඊට අදාළ කටයුතුවලට සම්බන්ධ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකින්, ආයතනයකින් හෝ නියෝජ්‍යායතනයකින් කැඳවා ලබාගැනීමට අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙයින් බලය පවරනු ලැබේ. අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ තොරතුරු සැපයීම, එකී දෙපාර්තමේන්තු, ආයතන හා නියෝජ්‍යායතනවල කාර්යය වන්නේ ය.

(3) සභාව විසින් යෝජනා කරනු ලබන යම් වෙනස් කිරීම් ඇතොත් ඒවා ද ඇතුළත් කිරීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල් විසින්, වෙරළ ප්‍රවේශ සැලැස්ම සභාවට ඉදිරිපත් කිරීමෙන් දින හැටක් ඇතුළත එකී වෙරළ ප්‍රවේශ සැලැස්ම විස්තර විවේචන

සඳහා ජනතාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වෙරළ ප්‍රවේශ සැලැස්ම ප්‍රයෝජනය සඳහා තමන් හට ලබා ගැනීමට සැලැස්වීමෙන් දින හැටක් ඇතුළත යම් ජනතා සාමාජිකයකු විසින් තම විස්තර විවේචන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ජනතාවගෙන් ලැබුණු යම් විස්තර විවේචන කිසිවක් සැලැස්මෙහි ඇතුළත් කර, ප්‍රතිශෝධිත සැලැස්මක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යය වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින්, ඉන් පසු ප්‍රතිශෝධිත වෙරළ ප්‍රවේශ සැලැස්ම අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී සැලැස්ම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමෙන් පසුව, අමාත්‍යවරයා විසින් වෙරළ ප්‍රවේශ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය. වෙරළ ප්‍රවේශ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක පටන්, ක්‍රියාත්මක විය යුතු ය.

(5) වෙරළ ප්‍රවේශ සැලැස්මේ ඇතුළත් කළ යුතු කාරණා ද, ඒ සැලැස්මට අනුකූලව කළ හැකි කටයුතු සහ ප්‍රමාණය හා පිහිටීම් ද ඇතුළුව සැලැස්මේ ඇතුළත් ඉඩම් අයිතිය පිළිබඳ විස්තර ද සඳහන් නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු වූ සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි වූ දඩයකට, නැතහොත් මාස තුනකට නොඅඩු වූ සහ අවුරුදු දෙකකට නොවැඩි වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක්

ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පනතේ විධිවිධාන 111අ, 111ආ, 111ඇ සහ 111ඈ යන කොටස් වලට අදාළ කිරීම.

22උ. පනතේ ඇතුළත් විධිවිධාන පනතේ 111අ, 111ආ, 111ඇ සහ 111ඈ යන කොටස් (මෙහි ඇතුළත් කොට ඇති ආකාරයට) ක්‍රියාත්මක කිරීමට අදාළ වන අවස්ථාවන්හි දී, පනතේ 111අ, 111ආ, 111ඇ සහ 111ඈ කොටස් සම්බන්ධයෙන් (මෙහි ඇතුළත් කොට ඇති ආකාරයට) අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "පෙර වෙරළේ හෝ වෙරළ කලාපය ඇතුළත පිහිටි මුහුදු පත්ලේ හෝ යම් කොටසක්" යන වචන වෙනුවට "වෙරළ කලාපය ඇතුළත පිහිටි පෙර වෙරළේ හෝ මුහුදු පත්ලේ හෝ යම් කොටසක් විද්‍යාත්මක අධ්‍යයන සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වෙරළ කලාපයේ ස්ථායිතාව" යන වචන වෙනුවට, වෙරළ කළාපයේ හෝ "වෙරළ කලාපය ඇතුළත සම්පත්වල ස්ථායිතාව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දැන්වීමක් භාර දුන් අවස්ථාවක, එසේ දැන්වීම භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත එකී දැන්වීමට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය. නිශ්චිත කාල පරිච්ඡේදය ඉකුත්වීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල් විසින්, එබඳු ඇතුලුවීම් හෝ ක්‍රියාකාරකම් වලක්වාලීම සඳහා අවශ්‍ය විය හැකි යම් පියවර ගනු

ලැබිය යුතු ය. බලෙන් ඇතුලුවීම් හෝ ක්‍රියාකාරකම් හෝ වලක්වාලීමේ දී අධ්‍යක්ෂ ජනරාල් විසින් දරන ලද සියලු වියදම් රජයට අයවිය යුතු ණයක් වශයෙන්, දැන්වීම භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු හට ද ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පළාත් පාලන ආයතනයකට නොහැකි වේ නම්" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, "පළාත් පාලන ආයතනයකට හෝ නියෝජ්‍යායතනයකට නොහැකි වේ නම්, ඒ නොහැකියාව පිළිබඳව එය විසින් වහාම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දිය යුතුය. එසේ දැනුම් දෙනු ලැබූ විට අධ්‍යක්ෂ ජනරාල් විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ අපද්‍රව්‍ය හෝ ආගන්තුක ද්‍රව්‍ය හෝ ඒ ක්‍රියාකාරකම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට, ශෝධක පියවර ගැනීමට හෝ ඒ ක්‍රියාකාරකමෙහි නියැලීමෙන් වැලකී සිටීමට හෝ නියම කරනු ලැබිය යුතු ය". යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ අවස්ථාවක, ඒ දැන්වීම භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, නිශ්චිත කාලය තුළ දී දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය. යුක්ති සහගත කාල පරිච්ඡේදයක් ඉකුත්වීමෙන් පසු, දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැත්තේ නම්, එකී බලෙන් ඇතුළුවීම හෝ ක්‍රියාකාරකම වලක්වාලීම සඳහා අවශ්‍ය විය හැකි යම් පියවර අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලැබිය යුතු ය. බලෙන් ඇතුළුවීම හෝ ක්‍රියාකාරකම වලක්වාලීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් දරන ලද සියලු වියදම්, රජයට අයවිය යුතු ණයක් වශයෙන්, දැන්වීම භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය "යම් අවසර පත්‍රයක" යන වචන වෙනුවට, "යම් අවසර පත්‍රයක හෝ මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කොන්දේසි පනවන ලද, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක හෝ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 26අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය.

"ක්‍රියාකාරකම් නතර කිරීම සඳහා විධාන නිකුත් කිරීම.

26අ (1) වෙරළ කලාපයට හෝ එහි සම්පත්වලට අලාභයක් හෝ හානියක් සිදු කරන්නාවූ හෝ සිදුවිය හැකි වූ යම් සංවර්ධන කටයුත්තක නිරතවන්නා වූ හෝ නිරත වනු ලැබිය හැකි වූ හෝ යම් තැනැත්තකු වෙත, ඒ අලාභය හෝ හානිය වලක්වාලීම හෝ නතර කිරීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල් සතු වන අතර, ඒ විධානවලට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන කිසිවකට අනුව කටයුතු කිරීම, යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ තැනැත්තා එකී විධානවලට අනුකූලව ක්‍රියාකරන තෙක්, ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම තාවකාලිකව අත්හිටුවිය යුතු යයි ආඥා කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින එක් එක් දිනය සඳහා රුපියල් දස දහසක දඩයකට යටත් විය යුතු ය. ඊට අතිරේකව, උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් ද වරදකරු විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය, එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්; සහ

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) (1) වන උපවගන්තිය ප්‍රකාර, නිකුත් කරන ලද දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත ඒ දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු, ඒ සම්බන්ධයෙන් සිහිකැඳවීමක් ඔහු වෙත යැවීමෙන් පසුවත් දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින්නේ නම්, ඔහු වෙත නිකුත් කරන ලද අවසර පත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) 14 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(අ) පළමුවන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට නොඅඩු වූ සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි වූ දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම, යන දඬුවම් දෙකටම හෝ යටත්විය යුතු ය ; තව ද,

(ආ) දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පනස් දහසකට නොඅඩු වූ සහ රුපියල් ලක්ෂයකට නොවැඩි වූ දඩයකට ද, නැතහොත්, අවුරුදු එකකට නොඅඩු වූ සහ අවුරුදු තුනකට නොවැඩි වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක්

ආකාරයක බන්ධනාගාරගත කිරීමකට, නැතහොත්, ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයේ "(ආ) ඡේදය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(ආ)ඡේදය යටතේ හෝ 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු වූ ද රුපියල් විසිපන්දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකට" යන වචන වෙනුවට, "රුපියල් පන්දහසකට නොඅඩු වූ ද රුපියල් පනස් දහස නොඉක්මවන්නා වූ ද, දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට, "එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසකට නොඅඩු වූ ද රුපියල් පන්දහස නොඉක්මවන්නා වූ ද දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තිය, එහි (3) වන (4) වන උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ විධානයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් දැන්වීම අලවනු ලැබූ දින සිට දින තුනක් ඇතුළත ඊට විරුද්ධව, වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(3අ) (3) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ලැබුණු විට, ලේකම් විසින්, සියලු අදාළ ලේඛන සහ ලිපිගොනු තමා වෙත ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්ට නියම

කරනු ලැබිය යුතු ය. එවැනි ඉල්ලීමක් කිරීමෙන් දින දාහතරක් (14) ඇතුළත, සියලු අදාළ ලේඛන සහ ලිපිගොනු කිසිවක් ඇතොත් ලේකම් වෙත ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යය විය යුතු ය. ලේකම් විසින්, තීරණයක් ගැනීම සඳහා අභියාචකට අවස්ථාවක් ලබා දීම අත්‍යාවශ්‍ය යයි තම මතය වන අවස්ථාවක, පෞද්ගලිකව කරුණු ඉදිරිපත් කිරීම සඳහා අභියාචකට අවස්ථාවක් ලබා දිය හැකි ය.

(3ආ) අභියාචනය ලැබී දින හතලිස් පහක් (45) ඇතුළත ලේකම් විසින්, ඒ අභියාචනය පිළිබඳව තීරණයක් කොට තමාගේ එම තීරණය අධ්‍යක්ෂ ජනරාල් සහ අභියාචක යන දෙදෙනා වෙතම දැනුම් දිය යුතු ය. ඒ තීරණය ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යය විය යුතු ය. එවැනි යම් අභියාචනයක් පිළිබඳව ලේකම්ගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(3ඇ) (2) වන උපවගන්තිය යටතේ විධානයක් භාර දෙනු ලැබ ඇත්තා වූ හෝ (3) වන උපවගන්තිය යටතේ විධානයට එරෙහිව අභියාචනා කරන ලද්දා වූ කිසිම තැනැත්තකු විසින්, ඒ ස්ථානයේ යම් ඉදි කිරීමක්, නිවසක්, ගෙපතක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක්, අනවසරයෙන් ඉදි කිරීම, හෝ තැනීම, නොකඩවා කරගෙන යාම හෝ ඒ ස්ථානයේ එවැනි යම් අනවසර ඉදි කිරීමක්, නිවසක්, ගෙපතක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් තිබෙන්නට අවකාශ දීම කරනු නොලැබිය යුතු ය.

(3ඈ) (3ඇ) උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොඅඩු වූ සහ රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු එකකට නොඅඩු වූ සහ අවුරුදු තුනක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය ප්‍රකාර බිඳ හෙළීමේ විධානයක් ලැබීමෙන් පසු හෝ (3) වන උපවගන්තිය ප්‍රකාර වූ අභියාචනයක් තීරණය කොට අවසන් කිරීමෙන් පසු

අනවසරයෙන් සාදන ලද ඉදි කිරීම, නිවස, ගෙපත, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ලක් බිඳ හෙළීමට සහ ඉඩමෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු ය. අනවසරයෙන් කරන ලද ඉදිකිරීම, නිවස, ගෙපත, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ල බිඳ හෙළීමට දරන ලද මුළු වියදම සහ අනවසරයෙන් කරනු ලැබූ ඉදි කිරීම, නිවස, ගෙපත, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ලේ ඉදි කිරීම සඳහා භාවිත කරනු ලැබූ සියලු ද්‍රව්‍ය ඉවත් කිරීමට දරන ලද වියදම එකී තැනැත්තාගෙන් රජයට අයවිය යුතු ණයක් ලෙස අයකර ගත යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත විධිවිධාන ප්‍රකාර, අනවසරයෙන් කරන ලද නිශ්චිතව සඳහන් යම් ඉදි කිරීමක්, නිවසක්, ගෙපතක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් බිඳ හෙළීමට සහ ඉවත් කිරීමට නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර, එවකට එකී අනවසරයෙන් කරන ලද ඉදිකිරීම, නිවස, ගෙපත, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ලක තිබූ ඔහු සන්තක සියලු දේ එයින් ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(4අ) ඉහත සඳහන් පරිදි අනවසරයෙන් කරන ලද ඉදි කිරීමක්, නිවසක්, ගෙපතක්, මඩුවක් හෝ ගොඩනැගිල්ලක් බිඳ හෙළීමෙන් පසු සහ ඉවත් කිරීමෙන් පසු කවර හෝ වේලාවක තම සන්තකයේ තිබූ යම් දෙයක් නැතිවී ඇති බවට යම් තැනැත්තකු කියා සිටින විටක, එකී බිඳ හෙළීමට සහ ඉවත් කිරීමට පෙරාතුව ම එකී දේ තමා සන්තකයේ තිබූ බව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ භාරය එකී තැනැත්තා සතු වන්නේ ය.

(4ආ) මේ වගන්තිය ප්‍රකාර වූ යම් නීති කෘත්‍යයක දී බිඳ හෙලා ඉවත් කරන ලද අනවසරයෙන් කළ ඉදිකිරීම්, නිවස, ගෙපත, මඩුව හෝ ගොඩනැගිල්ලේ පිහිටීම පිළිබඳව ප්‍රශ්නයක් මතුවන කවර හෝ අවස්ථාවක ඒ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතු සහතිකයක් සාක්ෂි ලෙස ආවේශ්‍ය විය යුතු අතර, එහි පිහිටීම සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ද වන්නේ ය.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 31 ආ ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"මුහුදු හිරිගල්. 31ආආ (1) වෙරළ කලාපය ඇතුළත හෝ ඉන් පිටත මුහුදු හිරිගල් කැනීම, එකතු කිරීම, සන්තකයේ තබා ගැනීම, සකස් කිරීම, ගබඩා කිරීම, පිළිස්සීම හා ප්‍රවාහනය කිරීමට අදාළව, 31අ සහ 31ආ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(2) යම් නඩු පැවරීමක දී කැනීම් කරන ලද, එකතු කරන ලද, සන්තකයේ තබා ගන්නා ලද, සකස් කරන ලද, ගබඩා කරන ලද, පුළුස්සන ලද, සහ ප්‍රවාහනය කරන ලද ද්‍රව්‍ය මුහුදු හිරිගල් ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් පැන නැගුනහොත්, අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන යටතේ වූ සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් එය බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඉ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වන වගන්තිය ප්‍රතිශෝධය කිරීම.

"වැලි හෝ සිප්පි කටු ප්‍රවාහනය සහ ගබඩා කිරීම. 30ඉ. (1) කවර හෝ පොලිස් නිලධරයකු හට—

(අ) වැලි හෝ සිප්පිකටු ප්‍රවාහනය කරන හෝ කරන්නේ යැයි සැක කරන යම් වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක් හෝ නැවක් නැවැත්වීමට හා පරීක්ෂා කිරීමට ;

(ආ) වැලි හෝ සිප්පිකටු ගබඩා කොට ඇති යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ ඒ පරිශ්‍රය පරීක්ෂා කිරීමට ;

බලය ඇත්තේ ය.

(2) එකී වැලි හෝ සිප්පිකටු නීත්‍යනුකූලව ලබාගත් බවට ඔප්පු කිරීමේ භාරය අවස්ථාවෝචිත පරිදි ඒ වැලි හෝ සිප්පිකටු ප්‍රවාහනය කරනු ලැබූ හෝ ගබඩා කරනු ලැබූ තැනැත්තා සතු වන්නේ ය.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ සියලු වචන වෙනුවට "මේ පනත යටතේ අය කරගන්නා ලද සියලු දඩ මුදල් සහ මේ පනතේ විධිවිධාන යටතේ අහිමි කරන ලද භාණ්ඩ බැහැර කිරීමෙන් ලබාගන්නා ලද සියලු මුදල් ප්‍රමාණය බැර කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවිය යුත්තේ ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) අරමුදල පරිපාලනය කිරීම සම්බන්ධයෙන් සහ අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් වගකිව යුතු ය. අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල් විසින්, වෙරළ සංරක්ෂණ විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ හා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වයෙන්, ත්‍යාගයක්

ලැබීමට සුදුසුකම් ඇති යම් තැනැත්තකු වෙත ත්‍යාගයක් ගෙවනු ලැබිය හැකි ය. එවැනි යම් ත්‍යාගයක් ගෙවීම් කිරීමේ යෝග්‍යතාවය සඳහා වූ සුදුසුකම් නිශ්චය කිරීමේ දී සහාය ලබාගැනීම පිණිස සැලසුම් කරන ලද මාර්ගෝපදේශ හා වෙනත් උපමාන අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31උ සහ 31ඌ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 31උ සහ 31ඌ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

"අවසර පත්‍රයක් නොමැතිව ඉඩම් හෝ ජලස්කන්ධ ගොඩකිරීම වරදක් බව.

31(උ). (1) වෙරළ කලාපය ඇතුළත යම් ඉඩමක් හෝ ජලස්කන්ධයක් ගොඩ කිරීම, අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව, කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන තැනැත්තා හෝ තැනැත්තන් වෙත දැනුම් දීමක් කරමින්, ප්‍රශ්නයට අදාළ ඉඩම හෝ ජලස්කන්ධය පිරවීම සඳහා පාවිච්චි කරන ලද දෙය හෝ ද්‍රව්‍ය වහාම ඉවත් කර අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ දැන්වීමේ නියම කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත, ඒ පිරවීම කිරීමට පෙරාතුව තිබූ තත්ත්වයට ඉඩම හෝ ජලස්කන්ධය පත් කළ යුතු යයි ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අධ්‍යක්ෂ ජනරාල් විසින් දැන්වීමක් මගින් විධාන කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද අධ්‍යක්ෂ ජනරාල්ගේ විධානය මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, තමා වෙත දැන්වීම භාරදෙන ලද දින සිට දින තුනක් ඇතුළත, වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්ගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ලැබුණු විට, සියලු අදාළ ලේඛන හා ලිපිගොනු තමා වෙත ඉදිරිපත් කරන ලෙස ලේකම් විසින් අධ්‍යක්ෂ ජනරාල්ට වහාම නියම කරනු ලැබිය යුතු ය. එවැනි ඉල්ලීමක් ලැබී දින හතක් ඇතුළත, සියලු අදාළ ලේඛන හා ලිපිගොනු කිසිවක් වෙතොත්, ඒවා ලේකම් වෙත ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යය විය යුතු ය. තීරණයකට එළඹීම සඳහා පෞද්ගලිකව කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් අභියාචකට ලබාදිය යුතු යයි තමාගේ මතය වන අවස්ථාවක, ලේකම් විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(5) අභියාචනය ලැබී දින තිහක් ඇතුළත, ඒ අභියාචනය පිළිබඳ සිය තීරණය ලේකම් විසින් කරනු ලැබ, සිය තීරණය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල් සහ අභියාචක යන දෙදෙනා වෙතම දැනුම් දිය යුතු ය. ඒ තීරණය බලාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යය විය යුතු ය. එවැනි යම් අභියාචනයක් පිළිබඳව ලේකම්ගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ විධානයක් භාරදෙනු ලැබ ඇත්තා වූ හෝ (3) වන උපවගන්තිය යටතේ වූ නියමයට එරෙහිව අභියාචනය කරනු ලැබ ඇත්තා වූ කිසිම තැනැත්තකු විසින් යම් ඉඩමක් හෝ ජලස්කන්ධයක් පිරවීම දිගටම කරගෙන යාම නොකළ යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොඅඩු වූ සහ රුපියල් පන් ලක්ෂයකට නොවැඩි වූ දඩයකට, නැතහොත් අවුරුදු එකකට නොඅඩු වූ සහ අවුරුදු තුනකට නොවැඩි වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා

විසින්, අනතුරුව, එකී දෙය හෝ ද්‍රව්‍ය අවස්ථාවෝචිත පරිදි, ඉඩමෙන් හෝ ජලස්කන්ධයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඉඩම හෝ ජලස්කන්ධය පිරවීම සඳහා පාවිච්චි කරන ලද දෙය හෝ ද්‍රව්‍යය ඉවත් කිරීමේ මුළු වියදම, රජයට අයවිය යුතු ණයක් වශයෙන් ඒ තැනැත්තාගෙන් අයකරගනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තිය ප්‍රකාර යම් නීති කෘත්‍යයක දී, තමන් පුරවා තිබූ සහ පිරවීම සඳහා පාවිච්චි කරන ලද දෙය හෝ ද්‍රව්‍යය තදනන්තරව ඉවත් කරනු ලැබ ඇත්තා වූ ඉඩමක් හෝ ජලස්කන්ධයක් තිබීම පිළිබඳ ප්‍රශ්නයක් පැන නගින කවර හෝ අවස්ථාවක දී වුව ද, අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන යටතේ වූ සහතිකයක්, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එය ඒ පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(9) ප්‍රශ්නයට අදාළ යම් ඉඩමක් හෝ ජලස්කන්ධයක් පිරවීම සඳහා පාවිච්චි කරනු ලැබූ දෙය හෝ ද්‍රව්‍යය එකී ඉඩමෙන් හෝ ජලස්කන්ධයෙන් ඉවත් කොට එකී ඉඩම හෝ ජලස්කන්ධය එසේ පිරවීමට පෙර තිබූ තත්ත්වයට පත් කිරීමට, (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබූ හෝ අභියාචනය ඉවත දැමීමේ දී ලේකම් විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබූ හෝ කාල පරිච්ඡේදය ඇතුළත යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල් විසින් අවස්ථාවෝචිත පරිදි එකී ඉඩමෙන් හෝ ජලස්කන්ධයෙන් එකී දෙය හෝ ද්‍රව්‍යය ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම හෝ ජලස්කන්ධය පිරවීමට පාවිච්චි කරනු ලැබූ දෙය හෝ ද්‍රව්‍යය ඉවත් කිරීම සඳහා දරන ලද මුළු වියදම රජයට අයවිය යුතු ණයක් ලෙස ඒ තැනැත්තාගෙන් අයකරගනු ලැබිය යුතු ය.

ඇප නොදිය යුතු බව.

31උ೪. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් නීති කෘත්‍ය පවත්නා අතරතුර දී මහෙස්ත්‍රාත්වරයකු විසින් ඇප නොදිය යුතු ය :

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පළාත් මහාධිකරණය විසින්, අධිකරණය සෑහීමකට පත් කරනු ලබන විශේෂිත අවස්ථානුගත කරුණු යටතේ චූදිත තැනැත්තකුට ඇප දෙනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මේ පනත යටතේ මාස 6 කට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීම මගින් දඬුවම් ලැබිය යුතු වරදක් කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වූ බවට හෝ එවැනි වරදක් කිරීම හා සම්බන්ධ බවට හෝ සාධාරණ ලෙස සැකකරනු ලබන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකුගේ නියෝගයක් නොමැතිව සහ වරෙන්තුවක් ලබා නොගෙන අත්අඩංගුවට ගැනීමට යම් පොලිස් නිලධරයකුට හැකිවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35අඅ සහ 35අඅඅ යන වගන්ති ඇතුළත් කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එකී ප්‍රඥප්තියේ 35අඅ සහ 35අඅඅ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

"පනත යටතේ වැරදි සංඥෙය වැරදි විය යුතු බව.

35අඅ. මේ පනත යටතේ ඇති සෑම වරදක්ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථයෙන් සහ එකී පනතේ කාර්යය සඳහා සංඥෙය වරදක් විය යුතු අතර එකී පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

නඩු පවරනු ලැබීමෙන් මුක්තිය.

35අඅඅ. මේ පනතේ විධිවිධාන යටතේ ක්‍රියා කරනු ලබන යම් පොලිස් නිලධරයකු විසින් මේ පනත යටතේ ඔහුගේ කාර්යයන් ඉටුකිරීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරවන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ පොලිස් නිලධරයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැක්කේ ය.

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "වෙරළ සංරක්ෂණය" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"වෙරළ ප්‍රවේශය" යන්නෙන්, භෞතික හෝ දෘශ්‍යමය වශයෙන් වෙරළ සීමාවට ළඟාවීමට, ඇතුල්වීමට හෝ එයට ඇතුල්වීම සඳහා පිවිසුම් මගක් භාවිත කිරීමට හෝ වෙරළ සීමාව දිගේ යාමට හෝ මහජනතාවට ඇති අයිතිය අදහස් වන අතර එයට, සාමාන්‍යයෙන් වෙරළ මායිමට සමාන්තර වූ ඉඩම් තීරුවක් හෝ වෙරළ තීරයට සමාන්තරව හෝ වෙරළ තීරය දිගේ දිවයන පටු පාරක් හෝ අඩි පාරක් හෝ ආසන්නතම ප්‍රසිද්ධ පාරක් ඍජුව දිවෙන මාර්ගයක් ඔස්සේ වෙරළ තීරයෙන් අවසන් වන්නා වූ ස්ථානයක් හා සම්බන්ධ කරන්නා වූ පටු පාරක් හෝ අඩිපාරක් හෝ වන්නා වූ වෙරළ තීරය දිගේ ඇති ප්‍රවේශයන් ඇතුළත් වන අතර, ප්‍රසිද්ධ පාරකින් මධ්‍ය අධි ජලමට්ටමට ඇති මාර්ගය හරහා වෙරළ තීරයට ඇති ප්‍රවේශයද ඊට ඇතුළත් වේ ;";

"වෙරළ සම්පත්" යන්නට වෙරළ කලාපය ඇතුළත තිබෙන්නා වූ සියලු ජීවී සහ අජීවී සම්පත් ඇතුළත් වේ ;

"කළමනාකරණය" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන යටතට ගැනෙන ධීවර හා ජලජ සම්පත් නොවන්නා වූ අලුත් කළ හැකි සහ අලුත් කළ නොහැකි වෙරළ සම්පත් වෙන් වෙන් වශයෙන් හෝ අනුකලණ ක්‍රමයක් මගින් කළමනාකරණය කිරීම අදහස් වේ.

(2)"වෙරළ කලාපය" යන යෙදුමේ අර්ථකථනයෙහි "වෙනත් යම් ජල කඳක් ද ඊට ඇතුළත් වේ" යන වචන වෙනුවට, "වෙනත් යම් ජල කඳක් සහ මායිම දිගේ ශුන්‍ය මධ්‍ය මුහුදු මට්ටමේ සිට ගොඩබිම දෙසට මීටර් සියයකින් දීර්ඝ කළ වැඩිදුර සීමාවක් ඇතුළත වූ ප්‍රදේශය ද ඇතුළත් වේ" යන වචන ආදේශ කිරීමෙන් ;";

(3) "පෙර වෙරළ" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:—

"මූලික පරිසර පරීක්ෂණ වාර්තාව" යන්නෙන්, පරිසරය පිළිබඳ සංවර්ධන කටයුත්තේ දී සිදුවිය හැකි ගැටුම් වැදගත් වේ ද යන්න ද එසේ වේ නම් පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීම අවශ්‍ය වන්නේ ද යන්න දැනගැනීමේ අදහසින් පිළියෙල කළ ලිඛිත වාර්තාවක් අදහස් වේ. ඒ වාර්තාවේ සංවර්ධන කටයුත්තට අදාළ සියලු විස්තර සහ විස්තරාර්ථ, දත්ත සිතියම්, දල සටහන් සහ වෙනත් තොරතුරු ඇතුළත් විය යුතු ය;";

(4) "ඍජු පාදක රේඛාව" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"සුනිත්‍යභාවය" යන්නෙන් කෙටිකාලීන ලාභ උදෙසා ප්‍රමාණය ඉක්මවා සූරා කෑම හේතුකොට ඇතිවන සම්පත් ක්ෂයවීමට

විකල්පයක් අදහස් වන අතරම, පුද්ගල විශේෂ සහ ප්‍රජා විශේෂ ජනතාවට එකී විශේෂයන්ගෙන් දැනට ලැබෙන ප්‍රයෝජන සහ මතුවට ලබාගත හැකි ප්‍රයෝජනයන්ට හානියක් නොවන පරිදි ඒවා යැපෙනු ලබන වටපිටාව සහ පරිසර පද්ධතිය සමගින්, ඥානාන්විතව පාවිච්චි කිරීම සහ සකසුරුවමින් කළමනාකරණය කිරීම ද අදහස් කෙරේ;";

(5) "රාජ්‍ය සංස්ථාව" යන යෙදුම පිළිබඳ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:—

"ජලස්කන්ධ" යන්නට, මුහුදට, වගුරු බිම්වලට, මඩතලවලට, කලපුවලට සහ කඩොලාන පිහිටි වගුරුවලට සම්බන්ධ වූ ගංගා සහ වෙනත් යම් ජලාශ ඇතුළත් වේ.".

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනතට සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතට කරනු ලබන සංශෝධන.

**37.** 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සහ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත, මේ පනතේ උපලේඛනයේ II වන තීරයෙහි දක්වා ඇති වගන්ති, මේ පනතේ උපලේඛනයේ I වන තීරයෙහි අනුරූපී සටහනෙහි දක්වා ඇති ප්‍රමාණයට සහ ආකාරයට සංශෝධනය කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

**උපලේඛනය** (35 වන වගන්තිය)

| **1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනතට කරනු ලබන සංශෝධන** | |
|---|---|
| *I වන තීරුව* | *II වන තීරුව* |
| *වගන්තිය* | *සංශෝධනයේ ප්‍රමාණය* |
| 2 වන වගන්තිය | ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-<br><br>"(5) මේ පනතේ ඇතුළත් කිසිවකින්, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, වෙරළ කලාපය ඇතුළත යම් ප්‍රදේශයක් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ බලය අමාත්‍යවරයා වෙත පිරිනැමෙන්නේ යයි නොසැලකිය යුතු ය.<br><br>මේ උපවගන්තියෙහි "වෙරළ කලාපය" යන්නට, 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ, එයට දී ඇති අර්ථයම ඇත්තේ ය.". |
| 9 වන වගන්තිය | (1) වන උප වගන්තියේ (ආආ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-<br><br>"(ආආ) ඒ ප්‍රදේශවල වරාය සහ නැංගුරම් ලන ස්ථාන ඉදිකිරීම් සහ වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ භාර ගැනීම;". |

**1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතට කරනු ලබන සංශෝධන**

| *I වන තීරුව*<br>*වගන්තිය* | *II වන තීරුව*<br>*සංශෝධනයේ ප්‍රමාණය* |
|---|---|
| 20 වන වගන්තිය | ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන්:-<br><br>"එසේ වුව ද, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාර මණ්ඩලය විසින් කිසිදු අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, නියමයක් හෝ නිවේදනයක් සෑදීම හෝ නිකුත් කිරීම හෝ මණ්ඩලය විසින් එකී පනත යටතේ යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍යයක් ඉටු කිරීම, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය නැතහොත් 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ පත් කරන ලද වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විමසා, ඔහුගෙන් ලබාගත් එකඟත්වය ඇතිව මිස, කරනු නොලැබිය යුතු ය.". |
| 20අ වගන්තිය | ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—<br><br>"එසේ වුව ද, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ හෝ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ වූ කිසිදු බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඉහත කී පනත යටතේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය හෝ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ පත් කරන ලද වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් හෝ විමසා, ඔහුගෙන් ලබාගත් එකඟත්වය ඇතිව මිස, කරනු නොලැබිය යුතු ය.". |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.